පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සතිය - 08

ශ්‍රේණිය - 6

විෂය - චිත්‍ර කලාව

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම :-** 4.2 ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු ක්‍රමය භාවිත කරයි.

**ක්‍රියාකාරකම :-** ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

**පියවර :-**

01. සීල් කිරීම සඳහා සුදුසු ද්‍රව්‍ය සපයා ගන්න. (අලපිති, දෙකට කැපූ බණ්ඩක්කා කැල්ලක්, ප්ලාස්ටික් දැල් කැබැල්ලක්, සිදුරු ලොකු ගෝනි කෑලි, බුරුසුවක්, පනාවක්, ...... )

02. ඔබ කැමති වර්ණ කිහිපයක්, ආරාධනා පත්‍රයක් සෑදීමට සුදුසු පරිදි සාදාගත් සුදු බ්‍රිසිල්බෝඩ් කැබැල්ලක් සපයා ගන්න.

03. දැන් ඔබ සපයා ගත් කාඩ්බෝඩ් කැල්ල ගෙන පින්සල් හා ස්පොන්ච් කැබැලි වලින් සම්පූර්ණයෙන් වර්ණ ගන්වන්න. එසේ වර්ණ ගන්වා අලපිති, බණ්ඩක්කා, ප්ලාස්ටික් දැල් ආදියෙන් සීල් තබා ගන්න. ඔබේ අත වුවද භාවිතා කළ හැකිය. පහත රූප බලන්න.









04. මදක් වියලෙන්නට තබන්න.

05. දැන් ඔබ වෙනම කාඩ්බෝඩ් කැබැල්ලක් ගෙන එහි පහත පරිදි අච්චුවක් කපා ගන්න.





07. දැන් ඔබ කලින් වර්ණ කර සකසා වියලා ගත් බෝඩ් එක මත මෙම අච්චුව තබා බුරුසුවට තීන්ත ගෙන පනාවේ පිරිමදින්න. එවිට අච්චුව මතට තීන්ත වැටී වර්ණ ගැන්වෙයි.

08. දැන් අච්චුව ඉවත් කරන්න.

09. විවිධ අක්ෂර භාවිතා කර **" *ආරාධනාවයි* "** යන්න ලියන්න.

10. ආරාධනා පත්‍රයක අඩංගු විය යුතු කරුණු ද සඳහන් කරන්න.